SC

# ශ්‍රී ලංකාවේ වී වගා රක්ෂණය : ක්‍රියාකාරීත්වය සහ ගොවීන්ගේ දායකත්වය (තෝරාගත් දිස්ත්‍රික්ක හතරක් ආශ්‍රිතව)

FGS/E/MSSC/2004/04

ආර්.වයි.ඩී.එම්.ආර්.එන්.කේ. රඹුක්වැල්ල


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 498 |
| වර්ග අංකය | |


සමාජීය විද්‍යාපති (ආර්ථික විද්‍යාව) පාඨමාලාව
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය
කැළණිය විශ්වවිද්‍යාලය

2008 පෙබරවාරි

## සංක්ෂේපය

කෘෂිකර්මාන්තය තුළ නියැළෙන ගොවීන්ගේ ආර්ථික ස්ථායීතාවය සහ ආයෝජන සුරක්ෂිතභාවය ඇති කරලීම මූලික අරමුණ කොටගත්, කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය, අවදානම් කළමනාකරණ උපකරණයක් වශයෙන් ඉතා වැදගත් මෙහෙයක් ඉටුකරනු ලබයි. කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය 1977/1978 මහ කන්නයේ මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 40%ක් රක්ෂණය කර ඇති අතර, එය 2004/2005 මහ කන්නය වන විට 1%ක් දක්වා අඩු වීමක් පෙන්නුම් කරයි. 2004/2005 මහ කන්නයේ දී රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශය ම රක්ෂණය කර ඇත්තේ මුළු වී වගා බිම් ප්‍රමාණයෙන් 2%ක් පමණි. කෘෂිකාර්මික රක්ෂණය ගොවීන්ගේ ඉල්ලුම මත ක්‍රියාත්මක නොවන අතර, වී වගා රක්ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ ස්වේච්ඡා සහභාගීත්වය ඉතාමත් අඩු මට්ටමක පවතී. ඒ සඳහා සිදු වූ හානි ප්‍රමාණයට සාපේක්ෂ ව ලැබෙන වන්දිය ප්‍රමාණවත් නොවීම, වන්දි ලැබීම ප්‍රමාද වීම, හානි තක්සේරුවේ දී මෙන් ම වන්දි ලබාදීමේ දී ද විනිවිද භාවයක් නොමැති වීම, හානිය අඩුවෙන් තක්සේරු කිරීම යන කරුණු හේතු වෙයි. රක්ෂණයට දායක වූ ගොවීන්ගෙන් 99%කට ආසන්න ප්‍රමාණයක් වගා ණය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් එයට දායක වී ඇත. 50%කට අධික ගොවීන් පිරිසක් වගා රක්ෂණය පිළිබඳ කිසිදු දැනුවත් භාවයක් ලබා නැත. රාජ්‍ය අංශය හා සැසඳීමේ දී, පෞද්ගලික අංශය වන්දි ගෙවීම සම්බන්ධයෙන් වඩා කාර්යක්ෂම හා කඩිනම් භාවයෙන් යුක්ත බව පෙනී යයි. කෙසේ නමුත් වගා රක්ෂණ ක්‍රමයේ මූලික අරමුණ වූ වගා හානි වීමකදී ගොවීන්ගේ ආදායම් ස්ථායීතාවය සහ ඔවුන්ගේ ආයෝජන සුරක්ෂිතතාවය යන කරුණු මෙම වගා රක්ෂණ ක්‍රමයෙන් ඉටු වී නොමැති බව ප්‍රකාශ කළ හැකිය.

සාර්ථක වගා රක්ෂණ ක්‍රමයක් සඳහා කඩිනම් විමර්ශනය, අප්‍රමාද වගා හානි තක්සේරුව සහ කඩිනමින් වන්දි ලබා දීම සිදු කළ යුතු අතර ඒ සඳහා වන්දි ගෙවීමේ බලය විමධ්‍යගත කිරීම සිදු කළ හැකිය. වගා හානි තක්සේරුව සඳහා පුහුණු නිලධාරීන් යෙදවිය යුතුය. රක්ෂණ කටයුතු හා එහි ප්‍රතිලාභ සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා සාර්ථක ව්‍යාප්ති සේවයක් පවත්වාගෙන යා යුතුය. රාජ්‍ය බැංකු මගින් වගා ණය ලබාගැනීමේ දී වගා රක්ෂණ ක්‍රමය අනිවාර්ය කළ යුතු අතර රාජ්‍ය අංශයේ ක්‍රියාත්මක සහනාධාර ක්‍රම සමඟ ද මෙය සම්බන්ධ කළ හැකිය. දේශපාලන මැදිහත් වීම්වලින් තොර ශක්තිමත් පදනමක් ඇති විය යුතුය. ප්‍රති රක්ෂණයට යොමු විය යුතු අතර ක්‍රමවත් පරිගණක ගත තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. එමෙන්ම කණ්ඩායම් වශයෙන් ගොවීන් රක්ෂණය කෙරෙහි යොමු කර විය යුතුය.